// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,119 — 1960 අප්‍රේල් 29 වැනි සිකුරාද — 29.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන — — | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 83 | මංගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් — — | 87 |


## අතුරු ව්‍යවස්ථා

L.G.D.—GB. 14/13/8.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ හබරාදූව ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පලාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ,
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 11 වෙනි දින,
කොළඹ දීය.

අතුරු ව්‍යවස්ථා

### අප්‍රසන්න වූ සහ අන්තරාදායක කර්මාන්ත

1. පහත දැක්වෙන කර්මාන්තයන් අප්‍රසන්නවූ කර්මාන්තයන් හැටියට සලකනු ලැබේ :—

(1) මාළු වියලා සකස් කිරීම,

(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,

(3) තොග ගණනේ විකිණීම සඳහා නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය හා සිල්ලර බඩු ගබඩා කිරීම,

(4) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම,

(5) රබර් වේලීම හෝ සකස් කිරීම,

(6) විනාකිරි සෑදීම,

(7) සබන් සෑදීම,

(8) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,

(9) පුවක් වියලා සකස් කිරීම,

(10) සතුන්ගේ ලේ හෝ මලකුනු උනු කිරීම,

(11) සතුන්ගේ හම් ගබඩා කිරීම,

(12) ඇටකටු ගබඩා කිරීම,

(13) මාළු අයිස් දැමීම,

(14) ලැලි පොහවා සකස් කිරීම,

(15) ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් සෑදීම හෝ දුම් ගැස්සීම,

(16) කෘත්‍රිම පෝර හෝ ඒවා සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම,

(17) පැනි හකුරු කර්මාන්තය,

(18) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම,

(19) සෝඩා සෑදීම,

(20) බීඩි සෑදීම,

(21) සුරුට්ටු සෑදීම.

2. පහත දැක්වෙන කර්මාන්තයන් අන්තරාදායක කර්මාන්ත හැටියට සලකනු ලැබේ :—

(1) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම,

(2) කොප්පරා සෑදීම,

(3) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් තෙල් සිඳීම,

(4) කබොක් බොරළු හෝ කළුගල් ලබාගැනීමට වලක් හෑරීම,

(5) කොප්පරා ගබඩා කිරීම,

(6) පිදුරු ගබඩා කිරීම,

(7) පොල් කපා සකස් කිරීම,

(8) මිනිරන් ගබඩා කිරීම,

(9) වලක් කැනීමෙන් හුනුගල් ලබා ගැනීම,

(10) යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් සිඳීම,

(11) සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම,

(12) හුනුගල් පිලිස්සීම හෝ ගබඩා කිරීම,

(13) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම,

(14) කපු පුලුන් නූල් ආදිය ගබඩා කිරීම,

(15) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් කුරුඳු තෙල් සිඳීම,

(16) ලී මඩුවක් තබා ගැනීම,

(17) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,

(18) හාල් මෝලක් තබා ගැනීම,

(19) කම්මලක් තබා ගැනීම,

(20) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම,

(21) අම්ලකර වායුව පාවිච්චි කරන කිසියම් කම්මල් කර්මාන්තයක් තබා ගැනීම,

(22) ස්වර්ණාභරන සෑදීම,

(23) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් පැඟිරි තෙල් සිඳීම.

3. පහත සඳහන් කර්මාන්ත අප්‍රසන්න හා අන්තරාදායක කර්මාන්ත හැටියට සලකනු ලැබේ:—

(1) කෙඳි වර්ග සායම් කිරීම,

(2) ගඩොල් හෝ උළු පිලිස්සීම,

(3) බැටරි චාර්ජ් කිරීම,

(4) හුනුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

### ගොඩනැගිලි හා මායිම් තාප්ප සෑදීම

4. (1) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ:—

(අ) ඕනෑම ගම්සභා පාරක් මැද සිට අඩි පහලොහක දුර ප්‍රමාණයක් ඇතුලත, හෝ

(ආ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහලොහක දුර ප්‍රමාණයක් ඇතුලත, හෝ

(ඇ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකියයි කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි පහලොහක දුර ප්‍රමාණයක් ඇතුලත, හෝ

(ඈ) මේ ඡේදයේ (ඇ) උප ඡේදයේ සඳහන් කරන ලද පාරකින් බාහිර වූ ඕනෑම ගම්බද අඩි පාරක් හෝ දෙවට පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුලත අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(2) කිසිවෙකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරනලද කිසියම් පාරක්, කරත්ත පාරක් හෝ අඩි පාරක් හෝ දෙවට පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම්ප්‍රදේශය ඇතුළත සෑදිය යුතු නැත.

### නිලධාරීන් සහ මෙහෙකරුවන්

5. (1) කාර්ය සභාවට එන්ට තිබෙන සියලුම අයබදු හා ගාස්තු එකතුකොට කාර්ය සභාවේ මුද්‍රාව හා ප්‍රධානතුමාගේ අත්සන නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධානතුමා විසින් ඕනෑම නිලධාරියකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

(2) කිසිවෙකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතේ හෝ ඒ ආඥාපනත යටතේ හෝ එය යටතේ සාදනලද යම් අතුරු ව්‍යවස්ථාවල හෝ යම් විධිවිධානයන් යටතේ හෝ ප්‍රධානතුමාට හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකුට පැවරී ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයන් ක්‍රියාවේ යෙදවීමේදී එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට, හෝ

(ආ) කාර්ය සභාව මගින් හෝ කාර්ය සභාව වෙනුවෙන් රක්ෂාවට යොදාගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩකරුවෙකුට ප්‍රධානතුමා විසින් හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට, හෝ ඕනෑකමින් බාධා නොකළ යුතුය.

6. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ හබරාදූව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"අඩිපාර නොහොත් දෙවට පාර" යනුවෙන් පලලින් අඩි හතරකට අඩු නොවූද එහෙත් පළලින් අඩිහයකට වැඩි නොවූද පාරක් අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්කාර්ය සභා ආඥාපනතේ (198 වෙනි පරිචෙඡදය) අදහස් කරනු ලැබේ;

"ගම්බද කරත්ත පාර" යනුවෙන් පළලින් අඩි නවයකට වඩා අඩු නොවූද එහෙත් පළලින් අඩි දහහතරකට අඩුවූද පාරක් අදහස් කරනු ලැබේ;

"ගම්සභා පාර" යනුවෙන් ගම්කාර්ය සභාව මගින් නඩත්තුකර ගෙනයනු ලබන්නා වූද පළලින් අඩි දහහතරකට වඩා අඩු නොවූ ද පාරක් අදහස් කරනු ලැබේ;

"ගම්බද මාවත" යනුවෙන් පළලින් අඩි හයකට වැඩිවූද එහෙත් පළලින් අඩි නවයකට අඩුවූද පාරක් අදහස් කරනු ලැබේ.

---

ඇල්. ඩී.—බී. 100/45

ඇල්. ජී. ඩී.—ජී. ජේ 15/37/4.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ උතුරු කඳුපිටපත්තුව හා දකුණු කඳුපිට පත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ,
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

1. (1) කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද අශූචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල vi. වැනි කාණ්ඩයේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්ය සභාව වෙත ගෙවියයුතු අශූචි ඉවත්කිරීමේ මාසික ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එක බැගින් වියයුතු වන්නේ ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ "කායඝී සභාව" යනුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ උතුරු කඳුපිට පත්තුව හා දකුණු කඳුපිට පත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

---

L.D.—B 108/46

L.G.D.—GJ9/20/1A

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිචෙඡදය) 49 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

1. (1) කාර්ය සභාවේ පාලන බලසීමාව ඇතුළත පිහිටි වගාකරන ලද සෑම ඉඩමකම අයිතිකරුවා විසින් හෝ භාරකරුවා විසින් හෝ දඩාවතේ යන ගවයන් හෝ වෙනත් සතුන් එකී ඉඩමට ඇතුල්වීම වැළැක්වීම සඳහා එකී අයිතිකරුවාගේ හෝ භාරකරුවාගේ හෝ අවශ්‍යතාවයන්ට අනුව වූ ගේට්ටුවක් ද සහිතව එම ඉඩම වටේ කටු කම්බි වැටක් හෝ ස්ථිර වැටක් සාදා තිබිය යුතු වන්නේ ය.

2. මේ අතුරු ව්‍යවස්ථාවේ, "කාර්ය සභාව" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කුකුල් කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ සොරණාතොට ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1\. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය හා සිල්ලර බඩු ගබඩා කිරීම,
(3) කොම්පෝස්ට් නොහොත් කෘත්‍රිම පොහොර සෑදීම,
(4) විනාකිරි සෑදීම,
(5) සබන් සෑදීම,
(6) දුම්කොළ වියළා සකස් කිරීම,
(7) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම,
(8) පුවක් වියළා සකස් කිරීම,
(9) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණු කිරීම,
(10) සතුන්ගේ හම් හෝ ඇට කටු හෝ ගබඩා කිරීම,
(11) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හා සෑදීම,
(12) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
(13) සෝඩා සෑදීම,
(14) ලෑලි පොඟවා සකස් කිරීම,
(15) මාළු අයිස් දැමීම,
(16) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම,
(17) පැණි හෝ හකුරු සෑදීම,
(18) රබර් වියලීම හෝ සෑදීම,
(19) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් මිරිස් හා තුනපහ ඇඹරීම,
(20) සුරුට්ටු සෑදීම,
(21) බීඩි සෑදීම,
(22) මීණිපෙට්ටි සෑදීම,
(23) රබර් ගබඩා කිරීම.

2\. පහත සඳහන් කර්මාන්ත අන්තරායදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) මෝටර් රථවාහන අලුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,
(2) කොප්පරා සෑදීම,
(3) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්‍රල් ආදී දැවෙන ද්‍රව්‍ය වලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන යම් කර්මාන්තයක්,
(4) කබුක්ගල්, බොරලු, කළුගල්, ලබාගැනීමට වළවල් කැනීම,
(5) මිණිරන් වියලීම හෝ ගබඩා කිරීම,
(6) වළක් කැනීමෙන් හුණුගල් ලබා ගැනීම,
(7) හාල් හෝ වී මෝලක් තබා ගැනීම,
(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම,
(9) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම,
(10) දර හෝ ලී මඩුවක් තබා ගැනීම,
(11) කෙඳි වර්ග නෙලීම හෝ ගබඩා කිරීම,
(12) භූමිතෙල් ගබඩාවක් තබා ගැනීම,
(13) කපු පුළුන්, නූල් හෝ පිදුරු ගබඩා කිරීම,
(14) මුද්‍රණාලයක් තබා ගැනීම,
(15) කපාපු පොල් සකස් කිරීම,
(16) ස්වර්ණාභරණ සෑදීම,
(17) අම්ලකර වායුව පාවිච්චි කරන ලෝකුරු වැඩ කිරීම,
(18) ගිණිකූරු සෑදීම,
(19) කොප්පරා ගබඩා කිරීම,
(20) පොල් කටු අඟුරු ගබඩා කිරීම,
(21) කම්හලක් තබා ගැනීම,
(22) ගෘහ භාණ්ඩ සෑදීම,
(23) වඩු කර්මාන්ත ශාලාවක් තබා ගැනීම,
(24) බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,

3\. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරායදායක කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි වර්ග සායම් කිරීම,
(2) ගඩොල් හෝ උළු පිච්චීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම, හෝ කැබලි කිරීම,
(5) අඟුරු සඳහා පොල් කටු පිළිස්සීම.

---

L.D.—B. 64/46.
L.G.D.—GA. 11/60/6.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

**ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම**

1\. (1) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ :—

(අ) කිසියම් ගම්බද පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) යථා කාලයේදී ගම්බද පාරක් බවට පත්කරණු ලැබිය හැකි යයි කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ කිසියම් ගම්බද මාවතක් මැද සිට අඩි පහළවක ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඉ) මේ ඡේදයේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද මාවතකින් බාහිරවූ කිසියම් මාවතක් මැද සිට අඩි අටක දුර ප්‍රමාණයක් ඇතුළත අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(2) කිසිවකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ ඡේදයේ සඳහන් කරන ලද කිසියම් ගම්බද පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය ඇතුළත සෑදිය යුතු නැත.

2\. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ ;

"කාර්ය සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ ;

"ගම් ප්‍රදේශය" යනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ ;

"ගම්බද පාර" යනුවෙන් ගම්කාර්ය සභාව මගින් නඩත්තු කර ගෙන යන්නාවූ ද පළලින් අඩි දොළහට අඩු නොවූද පාරක් අදහස් කරනු ලැබේ ;

"ගම්බද මාවත" යනුවෙන් ගම්කාර්ය සභාව විසින් නඩත්තු කර ගෙන යන්නාවූ ද පළලින් අඩි දොළහට වඩා අඩුවූද පාරක් අදහස් කරනු ලැබේ.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ මැදපලාත කෝරළේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවසථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1960ක්වූ අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවසථා

**ගොඩනැගිලි හා මාසිම් තාප්ප සෑදීම**

1. (1) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත;

(ආ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත්කරනු ලැබිය හැකි යයි කාර්ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත; හෝ

(ඇ) (ආ) උප ඡේදයේ සඳහන් කරණ ලද පාරකින් බාහිර වූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත

කිසියම් අලුත් ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(2) කිසිවකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී (1) වැනි ඡේදයේ සඳහන් කරන ලද කිසියම් කරත්ත පාරක් හෝ පාරක් අයිනේ කිසිම අළුත් ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය ඇතුළත සෑදිය යුතු නැත.

**නිලධාරීන් හා මෙහෙකරුවන්**

2. කාර්ය සභාවට එන්ට තිබෙන සියලුම අයබදු හා ගාස්තු එකතු කොට කාර්ය සභාවේ මුද්‍රාව හා ප්‍රධානතුමාගේ අත්සනේ නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධානතුමා විසින් ඕනෑම නිලධාරියකුට හෝ වෙනත් කෙනෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

3. කිසිවකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතෙන් හෝ ඒ ආඥාපනතේ හෝ එය යටතේ සාදන ලද අතුරු ව්‍යවසථාවල හෝ යම් යම් විධිවිධානයන් යටතේ හෝ ප්‍රධානතුමාට හෝ කාර්ය සභාවේ වෙනත් නිලධාරියකුට පවරා ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යක් ක්‍රියාවේ යෙදීමේදී එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට; හෝ

(ආ) කාර්ය සභාවෙන් හෝ කාර්ය සභාව වෙනුවෙන් රක්ෂාවට යොදා ගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩ කරුවෙකුට ප්‍රධාන තුමා විසින් හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතු කමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩ කරුවාට හෝ

ඕනෑ කමින් බාධා නොකළ යුතුයි.

4. මේ අතුරු ව්‍යවසථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ මැදපලාත කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත අදහස් කරනු ලැබේ.

---

## ගම් සභා ආඥාපනත

ගම් සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ කොහොන්සිය පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතවූ 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවසථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

**රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවසථා**

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබා ගෙන හෝ සිටින්නාවූ සෑම අයකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි සඳහන් "ඒ" උපලේඛනයෙහි ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක් ප්‍රධානතුමාට යැවිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලයෙන් ලබගත හැක.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1960 වැනි වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණකොට 1960 මාර්තු 31 වැනි දින හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිය හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛන යක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවසථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1960 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මැයි 31 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති, තවද

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් 30 කට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිද හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවසථාවේ සඳහන් උපලේඛනය සැපයූ වාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූද ආඥාපනත යටතේ බද්දට යටත්වූ ද යම් රථවාහනයක් හෝ සතකු අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එක්කෝ 1 වැනි අතුරු ව්‍යවසථා යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතකු පළමුවන වරට අත්පත් කරගෙන, තබා ගෙන හෝ පාවිච්චි යට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු රථවාහනයක් හෝ සතකු අත්පත්කර ගැනීමේ හෝ තබා ගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍ය යෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධානතුමාට දැනුම්දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැප යුවාවූ සෑම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනයේ හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයකු විසින් ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතූන් නිසා යයි දැක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය නො සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබාගැනීම හෝ පාවිච්චිකිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයකු විසින් ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චිකිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හළ බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් යම්කිසි රථවාහනයක් සඳහා බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ රථවාහන වෙනුවෙන් ඒ අයට මීට යාකොට ඇති "බී" උපලේඛනයෙහි දක්වෙන පරිදි ඒ ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුද නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම් ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධානතුමාට අපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් සත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් සත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත්කළ හැකිය.

7. සෑම රථවාහන අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරනලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක් ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා, නතර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1952කෝ දෙසැම්බර 26 වැනිදින අංක 10,481 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ ;

"කාර්‍ය සභාව" යනුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ කොහොන්සිය පත්තුව ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ඒ" උපලේඛනය

පෝරමය

අංකය :————.

කොට්ඨාශයේ අංකය :————.

**කොහොන්සිය පත්තුව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

| රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... | | |
| ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... | | |
| බරබාග කරත්ත හෝ තිරික්කල... | | |
| ජින් රික්ෂෝ රථ ... | | |
| බයිසිකල් ... | | |
| බයිසිකලයක් නම් එහි වර්ගය හා නොම්මරය සඳහන් කරනු ... | | |
| අලි ... | | |
| අශ්වයෝ ... | | |
| අශ්වතරයෝ ... | | |
| බූරුවෝ ... | | |

මෙහි ඉහත සඳහන් විස්තර සෑම අතින්ම සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයිතිකාරයාගේ අත්සන.

* නුවුමනා වචන කපාහරිනු.

"බී" උපලේඛනය

පෝරමය

| | | |
|---|---|---|
| බර කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා | ... | කො. ප. "ක." |
| ඕනෑම අන්දමක සෑම බර කරත්තයක් (ගොන් දෙන්නා බඳින) හෝ තිරික්කලයක් සඳහා | ... | කො. ප. "බ. ක." |
| සෑම බරබාග කරත්තයක් (තනි ගොනා බඳින) හෝ තිරික්කලයක් සඳහා | ... | කො. ප. "බ. බා." |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා | ... | කො. ප. "රි." |
| සෑම අත් කරත්තයක් සඳහා | ... | කො. ප. "අ. ක." |
| සෑම බයිසිකලයක් සඳහා | ... | කො. ප. "බ." |

# විවිධ දැන්වීම්

## ගල්බඩ කෝරළේ ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
### (201 වන පරිච්ඡේදය)

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන ගල්බඩ කෝරළේ ගම් ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිට පත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ, 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඇම්. ආර්. බී. දාස්වත්ත,
සභාපති.

ගම්කාර්‍ය සභා කාර්යාලය,
මාවනැල්ල.
1960 අප්‍රේල් මස 20 වන දින දීය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | බලපත්‍රයේ ස්වභාව |
|---|---|---|
| යූනස් ලෙබ්බෙ මහමදු සුබ්යර් | උයන්වත්ත ගමේ පල්ලෙහා වත්තේ "ඒ" කොටසේ රටඋළු සෙවිලි කළ කඩය | හරක් මස් |

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම්කාර්යසභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම්කාර්යසභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. සාලිබු | හරක්මස් හා එළුමස් | එළුවාපොල, වැවගම |
| කේ. මූසහීදු | හරක්මස් හා එළුමස් | ගල්ගම්මුල්ල කොලොන් ගස් හන්දිය, වැවගම |

ඒ. ඇම්. ගුණරත් හාමි,
මුරුතැන්ගේ ගම්කාර්යසභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය, මුරුතැන්ගේ,
න්ක්කවත්ත, 20.4.60.

## විශේෂ නිවේදනයයි

1960 මැයි 10 වැනි අඟහරුවාදා සහ 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 මැයි 13 වැනි දා නිකුත් කරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මැයි 6 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 අප්‍රේල් 9 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.